# කාර්ය සාධන වාර්තාව
# 2023

## සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
### මධ්‍යම පළාත

සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,
අංක 615, විලියම් ගොපල්ලව මාවත, මහනුවර.

cpcssd1@gmail.com

www.socialproba.cp.gov.lk

081-2223528

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය.

**1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 13 වන සංශෝධනය හඳුන්වා දෙන තෙක් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ රාජකාරි ඉටුකරනු ලැබූයේ එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් යටතේය. පරිවාස හා ළමරක්ෂණ සේවා දෙපාර්තමේනතුව මධ්‍යම රජයේ යටතේ පැවතුණු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභාවලට බලතල පැවරීමෙන් අනතුරුව, පළාත් අමාත්‍යාංශ ලේකම් හරහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරිම සඳහා පළාත් අධ්‍යක්ෂ හා පරිවාස දෙපාර්තමේනතුවේ රාජකාරි හා වගකීම් සහ අධිකාරි බලය ක්‍රියාත්මක කිරිම සඳහා පලාත් කොමසාරිස්වරයකු පවරනු ලැබිය. මෙම දෙපාර්තමේන්තු දෙක වෙන් වෙන් වශයෙන් 2011 වර්ෂය වනතුරු පැවතුනි.

2012 වර්ෂයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණි ගත කිරිමෙන් **සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** නමින් ස්ථාපිත විය. මෙම දෙපාර්තමේන්තුව පළාත් කොමසාරිස්වරයෙකු හා සහකාර කොමසාරිස් දෙදෙනෙක් යටතේ පරිපාලන හා අධික්ෂණ කටයුතු සිදුකරනු ලැබේ.

**සමාජසේවා අංශය**

සමාජ සුබසාධන කටයුතු ලෙස ආන්තිකරණය හා අවාසි සහගත තත්ත්වයට පත් ජනකොටස් ඉලක්ක කරමින් කටයුතු කිරිමේදි ඔවුන් මුහුණ දි ඇති ගැටළු අවම කිරිමට කටයුතු කිරිම දෙපාර්තමේන්තුව් ප්‍රමුඛ කාර්යවේ. මධ්‍යම පළාත තුළ සිටින කායික, මානසික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්වූවන්ට සහන සැලසීම හා ඔවුන් සවිබල ගැන්වීම තුලින් ජාතික සංවර්ධනයට දායක කරගැනීම, ජොෂ්ඨ පුරවැසියන්ගේ ක්‍රියාකාරි දායකත්වය ලබාගැනීම හා ඔවුන් ඇගයීම තුළින් ශක්තිමත් සමාජීය හා ආර්ථික තත්ත්වය ගොඩනැගීමටත්, ප්‍රජාව තුළ කාලීන පැනනගින සමාජ ගැටළු අවම කිරීම සඳහා ඔවුන්ගේ මානසික, ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකිරීමටත් දායකත්වයක් සපයනු ලැබේ. පලාත තුළ වැඩිහිටි නිවාස 17 හා ළමා ආබාධිත නේවාසිකාගාර 04 දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ පවතී. මාතලේ සහනෝදය ජොෂ්ඨ පුරවැසි නිවහන වැඩිහිටියන් 08 දෙනෙකුගෙන් යුක්තව 2022 වර්ෂයේ ආරම්භ කරන ලදි.. 2023 වර්ෂය අවසානය වන විට වැඩිහිටියන් 15 දෙනෙකුට රැකවරණය සපයන අතර එය දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතී.සමාජ සේවා අංශය මඟින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජොෂ්ඨ සමාජ සේවා නිලධාරින් හා මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 සඳහා සමාජ සේවා නිලධාරින් 36ක් අනියුක්ත කර ඇත.

**පරිවාස අංශය**

පරිවාස හා ළමාරක්ෂක කටයුතු යටතේ  දරුවන් සඳහා පුනරුත්ථාපනය, රැකවරණය සැලසීම සඳහා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රඥප්ති, අණ පනත් වලින්ම පවරා ඇත.  එබැවින් අත්හැර දමන ලද, අපයෝජනයට ලක් වූ සහ අවදානම්පාත්‍ර ළමුන් සඳහා රැකවරණය හා ආරක්ෂාව සැපයීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. රැකවරණය අවැසි දරුවන් සඳහා රැකවරණය සැලසීම, මූලික අවශ්‍යතා සපුරාලීම තුළින් අධ්‍යාපනය නගාසිටුවීම මෙන්ම  ඔවුන් නැවත සමාජගත කිරීම සිදුකරනු ලබන අතර ටිකිරි සෙවන පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ අවුරුදු 5ට අඩු දරුවන්ට රැකවරණය සපයනු ලැබේ. එමෙන්ම සමාජ විරෝධී කටයුතුවලට පුරුදු වූ දරුවන් පුනරුත්ථාපනය කිරීම හා රැකවරණය සඳහා  පළාතේ රැඳවුම් මධ්‍යස්ථානයක් (කාන්තා හා පිරිමි) 2 ක් ස්ථාපනය කර පාලන කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලැබේ. එමෙන්ම දරුවන් කෙරෙහි පවතින අභියෝග හඳුනාගනිමින් ඒවා අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන සේවා  ක්‍රියාත්මක කෙරේ. තවද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 34 ක් පවත්වා ගෙන යනු ලබන අතර එහි පූර්ණ අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යයන් පහසු කරවීම සඳහා මධ්‍යම පළාත තුළ අධිකරණ කොට්ඨාස අනුව පරිවාස කාර්යාල 11ක් පිහිටුවා ඇත. එම කාර්යාල සඳහා මූලස්ථාන ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි ඇතුළු දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීන් 04ක් ද  ස්ථානභාර පරිවාස නිලධාරීන් 11ක් හා පරිවාස නිලධාරීන් 25 ක් හා සංවර්ධන නිලධාරීන් ස්ථානගත කර ඇත. මීට අමතරව මෙම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා රජය හා රාජ්‍ය නොවන විවිධ සංවිධානවල සහය අප දෙපාර්තමේන්තුව වෙත ලැබේ. ඒ තුලින් අවම වරප්‍රසාද හිමි ජන කොටස් සඳහා යහපත් ජීවන තත්ත්වයක් ළඟාකර දීමත් අපගේ අරමුණ අතර වේ.

## 1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

- **දැක්ම**

අවාසි සහගත ප්‍රජාව උදෙසා ආරක්ෂිත හා රැකවරණය සපිරි සමාජයක්

- **මෙහෙවර**

ළමා කාළය ඵලදායි හා සුරක්ෂිතව ගතකිරීමට සුදුසු වටපිටාවක් නිර්මාණය කිරීමත්, සදාචාර පරිහානියට ලක්ව හා කායික, මානසික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයන්ට පත්වූ ජනතාව සමාජ සංවර්ධනයට දායක කරවීමට අවශ්‍ය මූල්‍ය, භෞතික හා තාක්ෂණික සහාය සාධාරණත්වයෙන් හා සමානාත්මතාවයෙන් සැලසීම.

- අරමුණු

1.අධිකරණය මගින් යොමුවන පුද්ගලයින් පුනරුත්ථාපනය හා නිවාරනය
2.භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමුන්ට රකවරණය සැලසීම
3.අවාසි සහගත පුද්ගලයින් සවිබල ගැන්වීම
4.දෙපාර්තමමේන්තු කාර්ය භාරය පළාත තුළ ශක්තිමත් කිරීම
5.දෙපාර්තමේන්තු සේවාව පුලුල් කිරීමට අදාලව ආයතන අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම
6. විෂයට අදාල නෛතික රාමුවසවිබල ගැන්වීම

**කාර්යයන්**

- පරිවාසිකයින් පුනරුත්ථාපනය සඳහා භෞතික හා මානව සම්පත් ස්ථාපිත කිරීම.
- පුනරුත්ථාපන ක්‍රමවේද සවිබල ගැන්වීම.
- පරිවාස හා ළමාරක්ෂක සේවා පුළුල් කිරීමට ආයතන අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම
- දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය ප්‍රජාව දැනුවත් කිරීම.
- පළාත තුල අපචාර හා අපයෝජන අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පවත්නා සමාජයන්ට අනුගත කිරීම සඳහා ප්‍රවේශයන් සකස් කිරීම.
- උපකාර අවශ්‍ය දරුවන් වෙනුවෙන් මැදිහත්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අදාල සියලු අංශ නියෝජනය වන පරිදි මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම.
- සංවිධාන වෙනසක් සඳහා පද්ධති සංවර්ධනය
- ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන රැකවරණ ආයතන විමර්ශනය,අධීක්ෂණය හා ආධාර ලබාදීම.
- එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පඥප්තිය ක්‍රියාවට නැංවීම.
- විෂයට අදාල නෛතික රාමුව සවිබල ගැන්වීම.
- ආයතන අතර අන්තර් සබඳතා ගොඩනැගීම සඳහා කමිටු පිහිටුවීම.
- තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සහ වැඩිහිටියන් ආබාධිත ළමා නේවාසිකාගාර හා වැඩිහිටි නිවාසවල රැකවරණය සැපයීම.
- ආබාධිත ළමා නේවාසිකාගාර හා වැඩිහිටි නිවාසවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මූල්‍ය ආධාර සැපයීම.
- ආබාධිත උපකරණ සැපයීම
- වෘත්තීය පුහුණුව සවිබල ගැන්වීම.
- වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමුකිරීම.
- යැපීම් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.
- ආර්ථිකමය ශක්තිමත්භාවය ඇතිකිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආබාධිත පුද්ගලයින්ගේ හා වැඩිහිටියන්ගේ අභිමානය ගොඩනැංවීමේ වැඩසටහන් සිදුකිරීම.
- උපදේශන සේවා සැපයීම.

**දෙපාර්තමේන්තුවෙන් පාලනය වන ආයතන**

අධිකරණ කලාප අනුව පරිවාස කාර්යාල

ටිකිරිසෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථානය

වෙරලවත්ත ළමා රැඳවුම් (ගැහැණු/පිරිමි) මධස්ථානය

මාතලේ සහනෝදය ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවහන

**දෙපාර්තමේන්තුවේ අංශ**

- පාලන අංශය

  **පලාත් කොමසාරිස්**

  පරිපාලන නිලධාරි, ප්‍රධාන කළමනාකාරණ සේවා නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරින් සහ කාර්යාල කාර්ය සේවකයකු ද පාලන අංශයේ සේවා සපයනු ලබයි.

- **ගිණුම් අංශය**

  ගණකාධිකාරි, මුදල් සහකාර, සංවර්ධන නිලධාරින්, කළමනාකරණ සේවා නිලධාරින්, කාර්යාල කාර්ය සේවක ගිණුම් අංශයේ සේවය කරනු ලබයි.

- **සංවර්ධන අංශය**

  සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරින් සැලසුම් හා සංවර්ධන අංශයේ සේවා සපයනු ලබයි.

- **සමාජසේවා**

  නියෝජ්‍ය කොමසාරිස්, ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරි, සමාජ සේවා නිලධාරින්, සංවර්ධන නිලධාරින් සමාජ සේවා අංශය යටතේ සේවා සපයනු ලබයි. සමාජ සේවා නිලධාරින් ප්‍රා.ලේ. කාර්යාලයන්ට අනියුක්තව සේවා සපයනු ලැබේ.

- **පරිවාස අංශය**

  නියෝජ්‍ය කොමසාරිස්, මූලස්ථාන ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි, සංවර්ධන නිලධාරින්, කාර්යාල කාර්ය සහායක ප්‍රධාන කාර්යාලයේ සේවා සපයනු ලැබේ.
  දෙපාර්තමේන්තුවට අයත් පරිවාස ඒකකයන්හි ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි, ස්ථානභාර පරිවාස නිලධාරින්, පරිවාස නිලධාරින්, සංවර්ධන නිලධාරින්, කාර්යාල කාර්ය සහායක සේවා සපයනු ලැබේ.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන





ආබාධිත සහිත වූවන්ගේ නිෂ්පාදන අලෙවි පොළ





1ලෝක ළමා දින සැමරුම් උත්සවය 2023 පල්ලේකැලේ පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.





නිවාසගත දරුවන් සඳහා පැවැත්වූ අවුරුදු උත්සවය






ළමා අපයෝජන අවම කිරීම පිළිබඳ ප්‍රචාරණ වැඩසටහන (ස්ටිකර්)